# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
# පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් - (HM 2-1) | - 01 |
| 2. අධ්‍යක්ෂ (පරිපාලන) - (HM 1-1) | - 01 |
| 3. අධ්‍යක්ෂ (මූල්‍ය) - (HM 1-1) | - 01 |
| 4. මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරි - (MM 1-1) | - 01 |
| 5. විද්‍යාත්මක නිළධාරි - (JM 1-1) | - 05 |
| 6. උපදේශන සහකාර - (MA 2-1) | - 20 |

**උපදේශන සහකාර හා විද්‍යාත්මක නිලධාරී තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2021.02.25 දින පුවත්පත් දැන්වීම හා 2021.02.25 දින ගැසට් පත්‍රයේ පල කර ඇති දැන්වීම අනුව අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් නැවතත් අයදුම්පත යොමු කිරීම අවශ්‍ය නොවේ.**

**01.** **තනතුරු නාමය - අධ්‍යක්ෂ ජනරාල්**
**සේවා ගණය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" -** HM 2-1
**පුරප්පාඩු ගණන - 01**

**01.1 සුදුසුකම්**

**01.1.1** බාහිර අයදුම්කරුවන් **(පහත සුදුසුකම් 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ ජනසන්නිවේදනය/ කළමනාකරණය/ සමාජවැඩ/ නීතිය/ වාණිජවේදී/ රසායන විද්‍යාව/ ගිණුම්කරණය/ තොරතුරු තාක්ෂණය/ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පශ්චාත් උපාධියක් ලබා තිබීම/ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක/ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ

තනතුරක අවම වශයෙන් වසර 20ක පළපුරුද්දක් තිබිය යුතු අතර අවම වශයෙන් මින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

හෝ

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ ජන සන්නිවේදනය/ කළමනාකරණය/ සමාජවැඩ/ නීතිය/ වාණිජවේදී/ රසායන විද්‍යාව/ ගිණුම්කරණය/ තොරතුරු තාක්ෂණය/ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ආචාර්ය උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක/ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්දක් තිබීම.

**01.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමඟ

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාව ලබා තිබීම.

**01.2 වැටුප් පරිමාණය** - රු.(91,645 - 12 x 2,700 - 124,045)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**02. තනතුරු නාමය - අධ්‍යක්ෂ (පරිපාලන)**
**සේවා ගණය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" -** HM 1-1
**පුරප්පාඩු ගණන - 01**

**02.1 සුදුසුකම්**

**02.1.1 බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමණාකරණ/ වාණිජවේදී/ මානව සම්පත් කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

**02.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි කළමනාකාර සේවා (MM) ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**02.2 වැටුප් පරිමාණය** - රු.(80,295 - 15 x 2,270 - 114,345/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**03. තනතුරු නාමය - අධ්‍යක්ෂ (මූල්‍ය)**

**සේවා ගණය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" -** HM 1-1

**පුරප්පාඩු ගණන - 01**

**03.1 සුදුසුකම්**

**03.1.1 බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජවේදී යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

**03.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි කළමනාකාර සේවා (MM) ගණයෙහි I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**03.2 වැටුප් පරිමාණය** - රු.(80,295 - 15 x 2,270 - රු.114,345/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**වයස : (ඉහත සඳහන් 01, 02 හා 03 තනතුරු සඳහා)**

අවුරුදු 35ට නොඅඩු හා 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**04. තනතුරු නාමය - මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරි**

**සේවා ගණය - "කළමනාකාර "** - MM 1-1

**පුරප්පාඩු ගණන - 01**

**04.1 සුදුසුකම්**

**04.1.1 බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

සහ

නීතිඥයෙකු හා නොතාරිස්වරයෙකු ලෙස වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**04.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**04.2 වැටුප් පරිමාණය** - රු.(53,175 - 10 x 1,375 – 15 x 1,910 - 95,575/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**05. තනතුරු නාමය - විද්‍යාත්මක නිලධාරි**

**සේවා ගණය - "කණිෂ්ඨ කළමනාකාර" - JM 1-1**

**පුරප්පාඩු ගණන - 05**

**05.1 සුදුසුකම්**

**05.1.1 බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**05.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 5ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.
3. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

4. බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**05.2 වැටුප් පරිමාණය** - රු.(42,600 - 10 x 755 – 18 x 1,135 - 70,580/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**වයස : (ඉහත සඳහන් 04 හා 05 තනතුරු සඳහා)**
අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**06. තනතුරු නාමය - උපදේශන සහකාර**

**සේවා ගණය - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණික - MA 2-1**

**පුරප්පාඩු ගණන - 20**

**06.1 සුදුසුකම්**

**06.1.1 බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සමඟ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් උපදේශනය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ මනෝ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**06.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**
ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**06.2 වැටුප් පරිමාණය -** රු.(30,310 - 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**06.3 වයස**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.

**වෙනත් :**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත යොමු කල යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වාභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**අයදුම්පත් ගාස්තුව**

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තු වශයෙන් රු. 500/- ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ රාජගිරිය ශාඛාවේ අංක 1643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ: (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාල සහතිකවල පිටපත් සමඟ **2023.11.17** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් **"අධ්‍යක්ෂ ජනරාල්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය"** යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ/ සංස්ථා හෝ

ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්/ අසම්පූර්ණ අයදුම්පත්/ අදාල සහතික පිටපත් අමුණා නොමැති අයදුම්පත්/ මුදල් ඇණවුම අමුණා නොමැති අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.**

**සභාපති**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

**383, කෝට්ටේ පාර,**

**රාජගිරිය.**

ප්‍රකාශිත දිනය : 2023.11.03

# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා අභ්‍යන්තරව අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු නාමය - සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක පර්යේෂණ)**
**සේවා ගණය - "කළමනාකාර" - MM 1-1**
**පුරප්පාඩු ගණන - 01**

**01.1 සුදුසුකම්**

**01.1.1 අභ්‍යන්තර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක ii වන ශ්‍රේණියෙහි වසර 5ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**01.2 වැටුප් පරිමාණය** - රු.(53,175 - 10 x 1,375 – 15 x 1,910 - 95,575/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**01.3 වයස**

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**<u>වෙනත්</u>**

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

**<u>අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම අදාල සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.</u>**

**<u>අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය</u>**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කල යුතුය.

**<u>බඳවා ගැනීමේ ක්‍රමවේදය</u>**

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**<u>පත්වීමේ ස්වභාවය</u>**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ : (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස ඉහල කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාල සහතිකවල පිටපත් සමඟ **2023.11.17** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් **"අධ්‍යක්ෂ ජනරාල්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය"** යන ලිපිනයට ලැබීමට සලස්වන්න. තම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

**අසම්පූර්ණ අයදුම්පත්/ නියමිත දිනට සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්/සහතික පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.**

**සභාපති**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

**383, කෝට්ටේ පාර,**

**රාජගිරිය.**

ප්‍රකාශිත දිනය : 2023.11.03